## බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.01.28

වේලාව : පෙ.ව.10.00

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රුමි මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**සහභාගී නොවූවෝ :-**

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර | ලේකම් |

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, 2010 වර්ෂයේ ප්‍රථම මහ සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලාත් , ලේකම් මහතා සහ පුවත්පත් කලාවේ දී මහතා සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන්ම පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා මෙම මස 26 දින පැවති , ශ්‍රී ලංකාවේ හයවැනි ජනාධිතිවරණයේ දී මේ රටේ ජනතාව නිවැරදි තීන්දුවක් ගනිමින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඓතිහාසික ජනවරමක් ලබාදී ඇතැයි පැවසීය. ඒ සම්බන්ධව සිය සතුට පළකල අතර , අතිගරු ජනාධිපතිතුමාට බලන්ගොඩ නගර සභාවේ උණුසුම් සුභ පැතුම් මෙම අවස්ථාවේ දී පළකරන කරන බව දැන්වීය. එසේම එතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් ඇප කැප වූ ඡන්දය ප්‍රකාශ කල මේ රටට ආදරය කරන දේශහිතෛෂී ,කෘතවේදී ජනතාවට සිය ගෞරවය හා ප්‍රණාමය පළකරන බවද සඳහන් කරන ලදී.

තව දුරටත් කථා කල ගරු සභාපතිතුමා , බළන්ගොඩ ආසනය එක්සත් ජනතා නිදහස් සංධානය වැඩි ඡන්ද 18,700/- කින් ජයග්‍රහණය කිරීම සම්බන්ධව ද සිය සතුට පළකල අතර , ඒ සඳහා නායකත්වය ලබාදුන් බළන්ගොඩ සම සංවිධායක පේෂකර්ම සංවර්ධන ගරු අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමා , සබරගමුව පළාත් සභා මන්ත්‍රී භාණු මුණිප්‍රිය මැතිතුමා,රත්නපුර දිස්ත්‍රික් සංවිධායක අකිල එල්ලාවල මැතිතුමා , බළන්ගොඩ නගර සභාවේ ගරු නාගරික මන්ත්‍රී.මන්ලා , බළන්ගොඩ හා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවල ගරු සභාපති/ගරු උපසභාපති, ගරු මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දේශපාලන නායකයින් සහ ඡන්ද ප්‍රකාශ ජනතාව වෙත සිය ස්තුතිය මෙම අවස්ථාවේ දී පළකරන බව දන්වමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2009.12.28 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා කථා කරමින් , පසුගිය සභා වාර්තාවේ තීරණ අංකඃ 10:02 යටතේ " විශාල වියදමක් දරා ඉදිකර ඇති සතිපොල කඩ කාමර ටෙන්ඩර් කිරීමේ දීවෙළඳුන් අතර අසමගියක් ඇති නොවන ආකාරයටත් , සභාවේ ගෞරවයආරක්ෂා කිරීමටත් කටයුතු කල යුතු නිසා , කඩකුළිය පමණක් අයකිරීමටයටත්ව මෙම කඩ කාමර බඳුදීම සුදුසු බවත් , එම කාර්යය පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ අධීක්ෂණය යටතේ සිදුකිරීම සුදුසු බව යෝජනා කරන ලදී. සතිපොල ඉදිරිපස ඇති කඩ කාමර 11 නගර සභා බලප්‍රදේශය තුළ පදිංචි අය වෙත ටෙන්ඩර් ලබාදීම සුදුසු බව යෝජනා කරන ලදී. යනුවෙන් සඳහන් ඇති බවත් එය , " විශාල වියදමක් දරා ඉදිකර ඇති සතිපොල කඩ කාමර ටෙන්ඩර් කිරීමේ දී වෙළඳුන් අතර අසමගියක් ඇති නොවන ආකාරයටත් , සභාවේ ගෞරවය ආරක්ෂා කිරීමටත් , මෙම කාර්යය විනිවිදභාවයකින් යුතු සිදුකල යුතු වන බව පැවසීය. එම නිසා සතිපොළ ඉදිරිපස කඩ කාමර 11 සහ ආපන ශාලාව ටෙන්ඩර් කිරීමටත් , අනෙකුත් පොල වෙළඳකුටි තක්සේරු වටිනාකම මත දැනට සතිපොළේ වෙළඳාම් කරන වෙළඳුන් වෙත ඉතා සාධාරණ ආකාරයට ප්‍රමුඛතාව මත බඳුදීම සුදුසු බවත් , මේ සියළු කටයුතු පළාත් පාලන කොමසාරිස්ගෙන් සැදුම්ලත් කමිටුවක් ඉදිරියේ දී සිදුකිරීම සුදුසු බවටත් යෝජනා කරන ලදී යනුවෙන් සංශෝධනය විය යුතු බව දැන්වීය.

ඉහත සඳහන් සංශෝධනයට යටත්ව ,2009.12.28 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **බළන්ගොඩ නගර සීමාව තුළ විදුලි පහන් නඩත්තු කිරීම:**

උක්ත කරුණට අදාළව , බළන්ගොඩ විදුලි අධිකාරී අමතමින් මෙම සභාවේ ගරු සභාපතිතුමාට ද පිටපත් සහිතව ප්‍රාදේශීය ලේකම් , බළන්ගොඩ විසින් එවා ඇති 2010.01.12 දිනැති ලිපියක් ගරු සභාවේ දැනගැනීම සඳහා සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සීමාව තුළ විදුලි පහන් නඩත්තු කිරීම නිසි පරිදි සිදුනොවන බව 2009.12.11 දින පැවැති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී මෙම නගර සභාවේ ගරු සභාපතිතුමා විසින් පවසන ලද බැවින් , කඩිනමින් මෙම ගැටළුවට විසඳුමක් ලබාදිය යුතු බැවින් , ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස එමගින් දන්වා තිබිණි.

05:02 **ඉන්ධන සීමාව පැනවීම:**

මෙම සභාවේ ගරු සභාපතිතුමා විසින් පාවිච්චිකරනු ලබන සභාව සතු නිල වාහනය සඳහා ඉන්ධන සීමාවක් පනවා ගතයුතුව ඇති බව දන්වමින් ඉදිරිපත් කර ඇති 2010.01.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ලීටර් 500 ක ඉන්ධන සීමාවක් පැනවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **2010 පෙබරවාරි 04 නිදහස් උත්සවය සැමරීම:**

ඉහත සඳහන් කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2010.01.21 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2010 පෙබරවාරි 04 දින නිදහස් උත්සවය පළාත් පාලන ආයතන මට්ටමින් සංවිධානය කර සැමරීම සුදුසු බව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් දන්වා ඇති අතර , එදිනට ආගමික හා සංස්කෘතික අංග මුල්කරගෙන නිදහස් උත්සවය පැවැත්වීම සුදුසු බවත් , දුගී මගී යාචකයන්ට දන්දීම හා ලේ දන්දීමේ ව්‍යාපාර ආදිය පැවැත්විය හැකි බැවින් , ඒ සඳහා ප්‍රදේශයේ ව්‍යාපාරික,දානපතීන් , මහජන නියෝජිතයින් , පාසැල් දරුවන් හා ජනතාවගේ සහයෝගය ලබාගන්නා ලෙසත් , සභා අරමුදලින් ද රු.10,000/- ක මුදලක් දැරීම සුදුසු බවත් එමගින් දන්වා ඇත.

බලන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ පිහිටි යසෝධරා අඳ ගොළු බිහිරි පාසලට හා ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාසයට රු.5000/- බැගින් වියළි ආහාර ද්‍රව්‍ය ලබාදීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කල අතර , එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:04 **ඉඩමේ අයිතිය පැවරීම:**

මෙම නගර සභාව සතු කිවුලෙවෙල පිහිටි ඉඩම් කොටසක් , රාස්සගල පාර , අංක: 91/5 දරණ ලිපිනයේ පදිංචි ඊ.ඒ.අජිත් යන අයට පදිංචිය සඳහා ලබා දී ඇති අතර , හදිසියේ පදිංචිය වෙනස් කිරීමට සිදු වූ බැවින් , එම ඉඩමේ අයිතිය සිය ඥාති සහෝදරියක වන ප්‍රියංගිකා අයිරාංගනී යන අයට පැවරීමට කැමැත්ත ප්‍රකාශ කරන බව දන්වමින් ඊ.ඒ.අජිත් යන අය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

දිවුරුම් ප්‍රකාශයක් ලබාගෙන නම සංශෝධනය කරදීමට තීරණය කරන ලදී.

05:05 **අඩක් සාදා ඇති පාරේ ඉතිරි කොටස සාදවා ගැනීම:**

මෙම සභාව විසින් ඕළුගන්තොට , රබර්වත්ත පාර සිරිපාල මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කර ඇතත් , ඉන් ඉදිරියට මාර්ගය සකස් නොකිරීම නිසා ප්‍රදේශවාසීන් ඉමහත් අසීරුතාවකට පත්ව ඇති බැවින් , ඒ කෙරෙහි අවධානය යොමු කර එම මාර්ගයේ ඉතිරි කොටස සකස් කරන මෙන් ඉල්ලා , ප්‍රදේශවාසීන්ගේ අත්සන් සහිතව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම මාර්ගය සදහා සභාවේ මුදල් නොයොදවා ඒ වෙනුවට වෙනත් ව්‍යාපෘතියක් මගින් ඉදිකරදීමට තීරණය කරන ලදී.

05:06 **<u>වරිපනම් අයකිරීම පිළිබඳව විරුද්ධත්වය ප්‍රකාශ කිරීම:</u>**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ කරව්කැටිය කොටසේ පදිංචිකරුවන් විසින් වාර්ෂිකව මෙම නගර සභාවට වරිපනම් ගෙව්ව ද , ඔවුනට ඉටුවිය යුතු වූ සේවාවන් ඉටුනොවන බැවින් , වරිපනම් ගෙවීමට විරෝධය ප්‍රකාශ කරමින් ප්‍රදේශවාසීන් විසින් එවා ඇති 2009.12.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

සියළු දෙනා කැඳවා මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට සභාව තීරණය කරන ලදී.

05:07 **<u>සභාව සතු වාහන සඳහා රියදුරන් යෙදවීම:</u>**

ගරු සභාපතිතුමන් විසින් කරනු ලද දැණුම්දීමකට අනුව , මෙම නගර සභාවට අයත් වාහන සඳහා රියදුරන් යොදවා ඇති ආකාරය හා රියදුරන්ගේ රාජකාරී වේලාවන් සම්බන්ධ විස්තරයක් සභාවට ඉදිරිපත් කර තිබුණි.

මෙම විස්තරයට අනුව ඉතිරිව පවතින අංකඃ එන්.ඩී.5124 දරණ වෑන් රථයට රියදුරෙකු නොමැති බැවින් , ආදේශක රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් දැන්වීය. මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව , පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව ආදේශක රියදුරෙකු බඳවාගැනීමට තීරණය කරන ලදී.

05:08 **<u>වරිපනම් බද්දෙන් නිදහස් කිරීම:</u>**

බළන්ගොඩ බුද්ධ ජයන්ති පාරේ පිහිටා ඇති අංකඃ 20 1/1 දරණ දේපලෙහි පවත්වාගෙන ගිය බේකරිය වර්ෂ ගණනාවක සිට වසා දමා ඇති බැවින් , වරිපනම් බද්දෙන් නිදහස් කරන මෙන් ඉල්ලා , බළන්ගොඩ , තුඹගොඩ,ජයන්ති පාර අංකඃ 20 /1 දරණ ලිපිනයේ පදිංචි එම්.ගුණදාස යන විසින් එවා ඇති 2010.01.28 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉඩමේ තක්සේරුව අනුව 2010 වර්ෂයට වරිපනම් අයකිරීමට සභාව තීරණය කරන ලදී.

05:09 **<u>කල්තොට පාර වරිපනම් අංකඃ123 දරණ ඉඩම සම්බන්ධවයි:</u>**

උක්ත කරුණට අදාළව , බළන්ගොඩ කල්තොට පාර අංකඃ 80 දරණ ලිපිනයේ පදිංචි එම්.ඒ.එස්.ඒ.විජයසිරි මහතා විසින් එවා ඇති 2010.01.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ , කල්තොට පාර අංකඃ123 දරණ ස්ථානයේ පැවති ගොඩනැගිල්ල කඩා ඉවත් කර ඇති අතර , දැනට එහි කිසිදු ව්‍යාපාර කටයුත්තක් නොකර මුඩු බිමක්ව පවතින බැවින් , එම ඉඩම වරිපනම් බද්දෙන් නිදහස් කරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

2010 වර්ෂයට ඉඩමට පමණක් වරිපනම් අයකිරිමට තීරණය කරන ලදී.

05:10 **<u>විදුණැන පියස මධ්‍යස්ථානයේ ඉන්ටර්නෙට් ගාස්තු අඩුකිරීම:</u>**

විදුණැන පියස මධ්‍යස්ථානයේ දැනට පැයක කාලයක් ඉන්ටර්නෙට් භාවිතා කිරීම සඳහා රු.50/- ක මුදලක් අයකරනු ලබන අතර , එය දැනට නගරයේ වෙනත් ස්ථාන වල අයකරන මුදලට වඩා වැඩි මුදලක් බැවින් , ඉන්ටර්නෙට් පැයක් භාවිතා කිරීම සඳහා රු.40/- ක දක්වා ගාස්තු අඩුකරන මෙන් ඉල්ලා 2010.01.28 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉන්ටර්නෙට් පැයක් භාවිතා කිරීම සඳහා රු.35/- ක මුදලක් අයකිරීමට තීරණය කරන ලදී.

05:11 **වරිපනම් අයකිරීම සම්බන්ධවයි:**

බළන්ගොඩ හපුතලේ පාරේ අංක:21/10 දරණ ස්ථානයේ පිහිටා ඇති ගොඩනැගිල්ලෙහි 2008 වර්ෂයේ සිට මේ දක්වා කිසිදු ආකාරයක ව්‍යාපාරික කටයුත්තක් සිදුනොකරන බැවින් , ඒ සඳහා ගෙවිය යුතු වරිපනම් බදු අයකරනොගන්නාලෙස ඉල්ලමින් , බළන්ගොඩ , හපුතලේ පාර අංක: 21/10 දරණ ලිපිනයේ පදිංචි කේ.ලෝගේෂ්වරන් යන අය විසින් එවා ඇති 2009.10.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2010 වර්ෂයට අදාළ බදු මුදලින් අඩක් අයකිරීමට තීරණය කරන ලදී.

05:12 **තක්සේරු මුදලට කඩ කාමරය ලබාගැනීම:**

බළන්ගොඩ , බස්නැවතුම්පල අංක : ඩී.25 දරණ කඩ කාමරයට කඩ කුළී ගෙවීම අපහසු බැවින් , එම කඩ කාමරය තක්සේරු මුදලට තමා වෙත බදු ලබාදෙන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ , අක්කර 18 අංක: 52 දරණ ලිපිනයේ පදිංචි ජී.ටී.පී.රත්නායක මහතා විසින් එවා ඇති 2010.01.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

සියළුම හිඟ මුදල් ගෙවන ලෙසත් , එසේ නොගෙවන්නේ නම් , වෙනත් අයෙකුට පැවරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

05:13 **රත්නපුර පාර අංක: 506/2, 506/3 එ දරණ දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම :**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

රත්නපුර පාර 506/2 හා 506/3 දරණ පැරණි දේපල කඩා ඉවත්කර නව අංක 506 , 506 ඒ යටතේ ඉදිකර ඇති බැවින් , 506/2 හා 506/3 දරණ අංක ලේඛනයෙන් ඉවත් කරන ලෙස ඉල්ලා තිබුණි.

ඒ අනුව 506/2 හා 506/3 දරණ දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:14 **මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2010**

උක්ත කරුණට අදාළව මහා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ( මග නැගුම ) විසින් එවා ඇති 2010.01.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එමගින් බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ පහත සඳහන් කර්මාන්තයන් සිදුකිරීම සඳහා ලක්ෂ 20 මුදලක් වෙන්කර ඇති අතර , එම මාර්ග සංවර්ධනය කිරීමේ දී කොන්ක්‍රීට් කුට්ටි අතුරා නිම කරන ලෙස දන්වා ඇත.

01. බළන්ගොඩ වැකුඹුර උඩකන්ද මාර්ගය
02. මැද කිරිදිගල මාර්ගය බෝක්කු දමා බැම් බැඳීම - 1 අදියර
03. මැද කිරිදිගල මාර්ගය බෝක්කු දමා බැම් බැඳීම - 2 අදියර
04. මැද කිරිදිගල මාර්ගය බෝක්කු දමා බැම් බැඳීම - 3 අදියර

මේ සම්බන්ධ සාකච්ඡා කල සභාව , අදාල මාර්ගයන් හි පිහිටීම අනුව කොන්ක්‍රීට් කුට්ටි අතුරා සකස් කිරීම කල නොහැකි බැවින් , මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා අදාල අනුමැතිය මහා මාර්ග අමාත්‍යාංශයෙන් ලබාගැනීමට තීරණය කරන ලදී. එසේම සම්බන්ධීකරණ නාමය නිවැරදි කරන මෙන් ද ඉල්ලීමක් කිරීමට තීරණය කරන ලදී.

05:15 **බස්නැවතුම්පල සිවිලිම අලුතින් ගැසීම :**

බලන්ගොඩ නගර සභා බස්නැවතුම්පල හා වෙළඳ සංකීර්ණයේ සඳහා යොදා තිබූ සිවිලිම සුළඟට කඩා වැටී ඇති බැවින් , ශක්තිමත් ආකාරයට අලුතින් සිවිලිමක් ගැසීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැණුම් දුන් අතර , ඒ සඳහා අධික මුදලක් වැයවන බැවින් , ඒ පිළිබඳව උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉංජිනේරුවරයෙකුගේ උපදෙස් පරිදි ඇස්තමේන්තුවක් සකස් කර අදාළ කාර්යය ඉටුකිරීමට සභාව තීරණය කරන ලදී.

## 06. මුදල් ගෙවීම් අනුමත කිරීම (10,000.00ට වැඩි ගෙවීම්)

2009.12.22 සිට 2010.01.15 දක්වා රු. 10,000.00ට වැඩි ගෙවීම් - පොදු ගිණුම

| දිනය | විස්තරය | ව.අ. | චෙක් අංකය | මුදල |
|---|---|---|---|---|
| 09.12.22 | **ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්**<br><br>බලන්ගොඩ තානායම අළුත්වැඩියා කිරීම සඳහා තානායමේ කාමර සඳහා යොදා ඇති කවුළු ආවරණය කිරීම සඳහා 5'x4' ප්‍රමාණයේ ග්‍රිල් 04 සැපයීම සඳහා<br>ඒකක මිල 8500.00<br>4 මිළ 8500x4<br>34000.00 | 87 | 649161 | 34,000.00 |
| | **ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්**<br>කාර්යාලීය පිටුපස වාහන , බයිසිකල් නතර කිරීම සඳහා හට් එකක් ඉදිකිරීම කර්මාන්තයේ වැඩ කුළිය සඳහා ගෙවීම | 88 | 649161 | 31,157.50 |
| 09.12.23 | ටොයෝටා ලංකා පුද්ගලික සමාගම<br>එන්.ඩී.5124 වෑන් රථය සේවා කිරීම සඳහා ගාස්තු ගෙවීම<br>ලි.4 ඔයිල් කෑන් 24 54264.00<br>ඔයිල් ෆිල්ටර් 04 10456.82<br>ඩීසල් ෆිල්ටර් 01 3304.00<br>68024.82 | 91 | 649170 | 68,024.32 |
| 09.12.23 | **සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය**<br>2009.10.26 සිට 2009.10.30 දක්වා ඉන්ධන බිල පියවීම. | 93 | 649172 | 68926.80 |

<table>
<tr><td></td><td><table><tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>ඩීසල්</td><td>73.20</td><td>836 ලීටර්</td><td>61195.20</td></tr><tr><td>පැට්‍රල්</td><td>130.20</td><td>58 ලීටර්</td><td>7551.60</td></tr><tr><td>ටූ.ටී</td><td>180.00</td><td>1 කෑන්</td><td>180.00</td></tr><tr><td></td><td></td><td></td><td>68926.80</td></tr></table></td><td></td><td></td><td></td></tr>
<tr><td>09.12.24</td><td>ඩබ්.ජී.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් බෝම්බුව පරගහකුඹුර ක්‍රීඩාපිටිය දැල් ආවරණය කිරීම සඳහා වැඩ කුලිය ගෙවීම</td><td>94</td><td>649173</td><td>10396.00</td></tr>
<tr><td></td><td>සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>පොදු වෙළඳසැල මාළු කඩ 2010 වර්ෂය සඳහා ටෙන්ඩර් දැන්වීම 2009.12.08 වන දින දිනමිණ පුවත්පතේ පළකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම</td><td>95</td><td>649174</td><td>29120.00</td></tr>
<tr><td></td><td>එස්.මනෝහරන්<br>2009 වර්ෂයේ පුවත්පත් පුස්තකාලයට සහ නව කියවීම් ශාලාවට ලබාදීම වෙනුවෙන් ගාස්තු ගෙවීම</td><td>97</td><td>649176</td><td>10660.00</td></tr>
<tr><td>09.12.24</td><td>එල්.ජී.සී.සී.මෙටල් ක්‍රෂර්<br>තානායමේ ප්‍රවේශ මාර්ගයේ බැම්ම ඉදිකිරීම සහ තානායම ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම<br><table><tr><td>වර්ගය</td><td>එකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>6x9ගල්</td><td>2300.00</td><td>11.66 කි.</td><td>26818.00</td></tr><tr><td>3/4ගල්</td><td>4800.00</td><td>02 කියුබ්</td><td>9600.00</td></tr><tr><td>1 1/2ගල්</td><td>4400.00</td><td>01 කියුබ්</td><td>4400.00</td></tr><tr><td></td><td></td><td></td><td>40818.00</td></tr></table></td><td>98</td><td>649177</td><td>40818.00</td></tr>
<tr><td></td><td>ජේ.ජී.ජී.වික්‍රමසිංහ<br>2009 නොවැම්බර් මස පුස්තකාලයට සහ කියවීම් ශාලාවට දිනපතා සහ සතිපතා පුවත්පත් සැපයීම</td><td>100</td><td>649179</td><td>16440.00</td></tr>
<tr><td></td><td>හර්ෂන කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>107</td><td>649184</td><td>29638.54</td></tr>
<tr><td></td><td>හර්ෂන කලර් සෙන්ටර්<br>තානායම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>109</td><td>649184</td><td>38000.48</td></tr>
<tr><td></td><td>හර්ෂන කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>110</td><td>649184</td><td>23546.46</td></tr>
</table>

<table>
<tr><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td>එල්.ඒ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් ලබාගැනීම
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>½ ගල්</td><td>3300/-</td><td>01 කි.</td><td>3300.00</td></tr>
<tr><td>¾ ගල්</td><td>4800/-</td><td>01 කි</td><td>4800.00</td></tr>
<tr><td>6x9ගල්</td><td>2300/-</td><td>11.88 කි</td><td>27324.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>35424.00</td></tr>
</table></td><td>111</td><td>649185</td><td>35424.00</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>තානායම් භූමියේ බැම්ම ඉදිකිරීම හා කාණුව ඉදිකිරීම කර්මාන්තයේ කටයුතු සඳහා ලබාගත් සිමෙන්ති මිටි 50 සඳහා ගෙවීම<br>ඒකක මිල (පැටවුම් කුලී සමග)740.00<br>සිමෙන්ති මිටි 50 සඳහා <u>740x50</u><br>37000.00</td><td>112</td><td>649186</td><td>37000.00</td></tr>
<tr><td>12/24</td><td>ජෝති ස්ටෝර්ස්<br>කාර්යාලීය කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>113</td><td>649187</td><td>34115.50</td></tr>
<tr><td></td><td>වැකර් ඉලෙක්ට්‍රිකල්ස් කම්පැනි<br>විථී පහන් නඩත්තුව සඳහා අවශ්‍ය විදුලි උපාංග ලබාගැනීම</td><td>114</td><td>649188</td><td>111216.00</td></tr>
<tr><td></td><td>ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්<br>බෝම්මුව පරගහකුඹුර ක්‍රීඩාපිටිය දැල් ආවරණය කිරීමේ කර්මාන්තය සඳහා 2x2 දැල් රෝල් 02 හා පැරණි පොළ පැවති ස්ථානයේ මැණික් කඩ කාමර පිටුපස හට් එකක් ඉදිකිරීම වෙනුවෙන් 2” GI බට දෙකක් ලබාගැනීම<br>වර්ගය ඒකක මිල ප්‍රමාණය වටිනාකම<br>2x2 22500/- රෝල් 2 45000/-<br>2" GI 3500/- බට 2 <u>7000/-</u><br>බට</td><td>115</td><td>649189</td><td>52000.00</td></tr>
<tr><td>12/29</td><td>රිෂානා සර්විස් ස්ටේෂන්<br>ජී.කේ.1483 - ජී.කේ.6227 ට්‍රැක්ටර් රථ දෙක සේවා කිරීම</td><td>118</td><td>649191</td><td>18155.00</td></tr>
<tr><td></td><td>සභාපති කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>මුගුණමලේ පාර උඩහගම පාරට සම්බන්ධ පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම</td><td>121</td><td>649194</td><td>491695.04</td></tr>
<tr><td></td><td>සභාපති, බුලත්ගම සුහඳ ග්‍රාම සංවර්ධන සමිතියවැලිහරනාව ජල ටැංකිය පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ රඳවුම් ගෙවීම හා ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම</td><td>122</td><td>649195</td><td>72792.78</td></tr>
</table>

<table>
<tr><td></td><td>රැඳවුම් මුදල 47792.78<br>ගිවිසුම් ඇප තැන්පත් 25000.00<br>72792.78</td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා සිමෙන්ති මිටි 50 ලබාගැනීම<br>සිමෙන්ති එකක් 735.00<br>සිමෙන්ති මිටි 50 735x50<br>36750.00</td><td>126</td><td>649199</td><td>36750.00</td></tr>
<tr><td>12/29</td><td>කළමනාකරු , ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රක්ෂණ කාල සීමාව අවසන් වාහන සඳහා 2010 වර්ෂයට රක්ෂණාවරනය ලබාගැනීමට මුදල් ගෙවීම
<table>
<tr><td>වාහන අංකය</td><td>මුදල</td></tr>
<tr><td>JD 4684</td><td>5634.00</td></tr>
<tr><td>HF 2234</td><td>1143.5</td></tr>
<tr><td>HF 2269</td><td>1143.45</td></tr>
<tr><td>HF 8558</td><td>8451.30</td></tr>
<tr><td>HF 8952</td><td>8451.30</td></tr>
<tr><td>56-1906</td><td>20766.08</td></tr>
<tr><td></td><td>45590.02</td></tr>
</table></td><td>128</td><td>649201</td><td>45590.00</td></tr>
<tr><td></td><td>කළමනාකරු එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම එන්.ඩී.5124 වෑන් රථයට DVD PLAYER එකක් සහ සභාවට යතුරු පැදියක් මිළදී ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් 02 2009.12.10 දිනමිණ පුවත්පතේ පළකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම</td><td>129</td><td>649202</td><td>13977.60</td></tr>
<tr><td></td><td>ටී.එම්.නිහාල් රත්නසිරි<br>නගර සභා කර්යාලයේ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමත් සමගම විදුලි පද්ධතිය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම<br>ප්‍රධාන මහරු පුවරුවක් සහ<br>බෙදා හැරීමේ පුවරු 03සඳහා රු.4500/-<br>ගණකාධිකාරී මහතාගේ නිල<br>කාමරයේ විදුලි අ.වැ.සහ<br>දුරකථන මග සවිකිරීම 2750/-<br>ප්‍රධාන සැපයුම සඳහා "L"<br>අයන් එකක් සවිකිරීම 500/-<br>තෙකලා වායු සමීකරණ යන්ත්‍රය<br>සඳහා විදුලි රැහැන් ඇදීම හා<br>උපාංග සවිකිරීම 4500/-<br>කාර්යාලය දෙපස අක්‍රියව තිබූ<br>විදුලි පරිපථ අ.වැ.කිරීම. 2000/-</td><td>132</td><td>649204</td><td>21050.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | සභාපතිතුමාගේ කාමර දෙපස<br>5 A ප්ලග් 3 සහ 15A ප්ලග් 01<br>සවිකිරීම 1300/-<br>කාර්යාලයේ අබලන් ස්විච් සහ<br>ප්ලග් අලුතින් සවිකිරීම 5500/- | | | |
| | සේරසිංහ ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්<br>හරස් සටහන් පොත් 50 ක් ලබාගැනීම<br>පොත් එකක මිල 275.00<br>පොත් 50 සඳහා 275x50<br>**13750** | 133 | 649205 | 13750.00 |
| | ඩැක්ස් ඉංජිනියරින් පුද්ගලික සමාගම<br>බොබ් කැට් යන්ත්‍රයේ මීටර් පැය 1750 සේවාව වෙනුවෙන් මුදල් ගෙවීම | 134 | 649206 | 29623.42 |
| 12/30 | ඩබ්.ඒ.එන්.ප්‍රේමතිලක<br>දසමස් වැටුප් අත්තිකාරම් මුදලින් කොටසක් ගෙවීම | 135.4 | 649207 | 100000.00 |
| | තාවකාලික වැටුප්<br>නගර සභා බලප්‍රදේශයට අලුතින් එක් වූ දේපල තක්සේරු කිරීමේ දී සහයකයින් සඳහා දීමනා ගෙවීම - 2009 දෙසැම්බර් මාසය | 138-2 | 649210 | 28000.00 |
| 12/30 | ඩබ්.එස්.වීරවංශ<br>නගර සභා ගොඩනැගිල්ලේ ආරක්ෂක කුටියක් ඉදිකිරීම සඳහා ගෙවීම<br>වහල සඳහා වර්ග අඩි 01 - 105.00<br>අඩි 476 105x476- 49980.00<br>වඩිම්බු සඳහා දි.අ.80 50x80 4000.00<br>53980.00 | 139 | 649211 | 53980.00 |
| | තාවකාලික වැටුප්<br>තාවකාලික කම්කරු වැටුප් ගෙවීම<br>කර්මාන්ත අංශය | 140-2 | 649212 | 197125.00 |
| | හර්ෂණ කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 142 | 649214 | 23255.40 |
| | හර්ෂණ කලර් සෙන්ටර්<br>තානායම තීන්ත ආලේප කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 143 | 649214 | 60500.30 |
| | කළමනාකරු , ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>2009 දෙසැම්බර් මස ජල බිල පියවීම<br>පොදු වෙළඳසැල 15344.00<br>පිංතාලිය 1111.04<br>තානායම **3444.60**<br>19899.64 | 145 | 649215 | 19899.64 |

| | | | | |
|---|---|---|---|---|
| 12/30 | ඩබ්.එස්.පැකේජින්<br>සම්පත් කේන්ද්‍ර විවෘත කිරීමේ උත්සවය සඳහා ආරාධනා පත්‍ර 150 සකස් කරගැනීම<br>එකක මිල 72.50<br>ආරාධනා පත්‍ර 150 72.50x150<br>10875.00 | 155 | 649223 | 10875.00 |
| | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම<br>සම්පත් කේන්ද්‍ර මධ්‍යස්ථාන සඳහා මුළු මුදල් පෙට්ටි 05 ලබාගැනීම<br>එකක මිල 2100.00<br>පෙට්ටි 05 2100x5<br>10500.00<br>Vat මුදල 1260.00<br>11760.00 | 156 | 649224 | 11760.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල පියවීම් 2009 නොවැම්බර්<br>දුරකථන අංකය මුදල<br>2287275 6816.98<br>2287153 3262.57<br>2286596 7573.42<br>2288737 3070.45<br>E-mail 230.92<br>29954.34 | 157 | 649225 | 29954.34 |
| | මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්.සමාගම<br>කාර්යාලයේ NP1215 ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 159 | 649226 | 33852.09 |
| | කළමණාකරු ඩේවිඩ් පීරිස් මෝටර් පුද්ගලික සමාගම<br>නගර සභාවට XCD DPS-SI 135 CC Bajaj යතුරු පැදියක් මිළදී ගැනීම | 161 | 649228 | 148960.00 |
| | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2009 දෙසැම්බර් මස විදුලිබිල පියවීම<br>කාර්යාලය 25531.50<br>නගර සභාවට යාබඳ<br>ගොඩනැගිල්ල 883.50<br>26415.00 | 165 | 649229 | 26415.00 |
| | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2009 දෙසැම්බර් මස විදුලි බිල පියවීම<br>පො.වෙ.සැල. 10926.00<br>ප්‍රේක්ෂකාගාරය 435.00<br>තානායම නිල නිවස 154.70<br>තානායම 240.00<br>11755.70 | 167 | 649229 | 11755.70 |

<table>
<tr><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී - ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br><br>2009.11.15 සිට 2009.11.20 දක්වා ඉන්ධන බිල
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>473 ලීටර්</td><td>34623.60</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>323.00</td><td>01 කෑන්</td><td>323.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>130.20</td><td>26 ලීටර්</td><td>3385.20</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>05 ලීටර්</td><td>256.00</td></tr>
<tr><td>ටූ.ටී.1/2</td><td>180.00</td><td>01 කෑන්</td><td>180.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>38767.80</td></tr>
</table></td><td>171</td><td>649234</td><td>38767.80</td></tr>
<tr><td>12/30</td><td>සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2009.11.04 සිට 2009.11.11 දක්වා ඉන්ධන බිල
<table>
<tr><td>වර්ගය</td><td>එකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>1025 ලී.</td><td>75030.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>130.20</td><td>37 ලී.</td><td>4817.40</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>5 ලී.</td><td>256.00</td></tr>
<tr><td>හයිඩ්‍රොලික්</td><td>5605</td><td>20 ලී.කෑන්</td><td>5605.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>85708.40</td></tr>
</table></td><td>172</td><td>649234</td><td>85708.40</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2009.11.03 සිට 2009.11.11 දින දක්වා ඉන්ධන බිල
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>877 ලී</td><td>64196.40</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>446.00</td><td>02 කෑන්</td><td>892.00</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>323.00</td><td>02 කෑන්</td><td>646.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>130.20</td><td>77 ලී</td><td>10025.40</td></tr>
<tr><td>ටූ.ටී.1/2</td><td>180.00</td><td>01 කෑන්</td><td>180.00</td></tr>
<tr><td>කලර්</td><td>304.00</td><td>05 ලි.කෑන්</td><td>1520.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>77459.80</td></tr>
</table></td><td>173</td><td>649234</td><td>77459.80</td></tr>
<tr><td></td><td>කේ.ඩබ්.ඒ.සිරිපාල<br>නගර සභාවේ සභා ගර්භය සඳහා කවීක ආසන 01 සහ පළාත් පාලන කොඩි 05 ක් සඳහා ගෙවීම</td><td>177</td><td>649238</td><td>25000.00</td></tr>
</table>

<table>
<tr><td></td><td><table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>කවීක ආසන</td><td>20000.00</td><td>01</td><td>20000.00</td></tr>
<tr><td>පළාත් පාලන කොඩි</td><td>1000</td><td>03</td><td>5000.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>25000.00</td></tr>
</table></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td>ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම අලුත්වැඩියා කිරීමට අවශ්‍ය<br>ඉදිකිරීමේ උපාංග ලබාගැනීම</td><td>178</td><td>649239</td><td>116815.50</td></tr>
<tr><td></td><td>ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම අලුත්වැඩියා කිරීමට අවශ්‍ය ඉදිකිරීම්<br>උපාංග ලබාගැනීම</td><td>179</td><td>649239</td><td>17666.50</td></tr>
<tr><td></td><td>ජගත් එන්ටර්ප්‍රයිසස්<br>තානායම අලුත්වැඩියාව සහ ළදරු පාසල්<br>ගොඩනැගිල්ල අලුත්වැඩියාව වෙනුවෙන්<br>අවශ්‍ය ගඩොල් 3100 මිළදී ගැනීම<br>ගඩොල් 01 මිළ 6.50<br>ගඩොල් 3100 6.50x3100</td><td>180</td><td>649240</td><td>20150.00</td></tr>
<tr><td></td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2009 ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට<br>අදාල ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය<br>ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම<br>ඔක්තෝබර් 36122.00<br>නොවැම්බර් 27030.00</td><td>188</td><td>649242</td><td>63152.00</td></tr>
<tr><td></td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2009 පෙබරවාරි හා මාර්තු මාස වලට අදාළ<br>ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම්<br>කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම<br>පෙබරවාරි 11300.00<br>මාර්තු 12065.00</td><td>189</td><td>649242</td><td>23365.00</td></tr>
<tr><td></td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2009 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලට<br>අදාළ රැඳවා ගැනීමේ බදු මුදල් දේශීය<br>ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම</td><td>190</td><td>649242</td><td>177454.65</td></tr>
<tr><td></td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2009 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලට<br>අදාළ 1% පිරිවැටුම් බදු මුදල් දේශීය ආදායම්<br>කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම</td><td>191</td><td>649243</td><td>24832.54</td></tr>
<tr><td></td><td>2010 ජනවාරි මාසය</td><td></td><td></td><td></td></tr>
<tr><td>01/04</td><td>විශේෂ අත්තිකාරම් ගෙවීම<br>කර්මාන්ත අංශය 45000.00<br>ආදේශක සේවය 12500.00<br>පොදු අංශය 45000.00<br>සෞඛ්‍ය අංශය 27500.00<br>130000.00</td><td>01-1</td><td>649101</td><td>130000.00</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 01/05 | බී.ගුණරත්න<br>නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සේවකයන් යෙදවීම 2009.12.16 සිට 2009.12.31 දක්වා | 03 | 649103 | 100583.33 |
| | රිචඩ් ප්‍රැන්සිස්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වැලි කියුබ් 13.52 ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම<br>වැලි කියුබ් 01 මිළ 3750.00<br>වැලි කියුබ් 13.52 සඳහා 3750x13.52 | 04 | 649104 | 50700.00 |
| 01/08 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 50 මිළදී ගැනීම<br>සිමෙන්ති මිටි 01 735.00<br>සිමෙන්ති මිටි 50 සඳහා 735x50 | 08 | 649108 | 36750.00 |
| | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>තානායම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය ඉදිකිරීම් උපාංග මිළදී ගැනීම | 09 | 649109 | 39870.00 |
| | සෙවන ග්ලාස් හවුස්<br>කාර්යාලයේ සවිකර ඇති බිත්ති කබඩ් දොරවල් 05, සභාපතිතුමාගේ කාමරයේ ඇති නාන කාමරයේ දොර 12" කර්ටන් බාර් සවිකිරීම - ඩිජිටල් ප්‍රින්ටින් බෝඩ් 05 සඳහා ගෙවීම | 10 | 649110 | 86650.90 |
| | සභාපති, බලගහමුල සමෘද්ධි සමිතිය<br>සේනක පෙදෙස කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීම හා වේගඟ දක්වා ඇති ඇල මාර්ගය සකස් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම<br>මුළු වැඩ වටිනාකම 528380.13<br>ප්‍රජා දායකත්වය(අඩුකලා) 107208.32 | 11 | 649111 | 421171.81 |
| | තාවකාලික වැටුප්<br>තක්සේරු සහයකයින් සඳහා දීමනා ගෙවීම | 12-7 | 649112 | 15500.00 |
| | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>තානායම අලුත්වැඩියාව , බැංකියවත්ත ගලිවල ඉදිකිරීම , ගල්වල පාර කොන්ක්‍රීට් කිරීම සඳහා අවශ්‍ය ඉදිකිරීම් උපාංග ලබාගැනීම | 15 | 649127 | 39272.00 |
| 1/13 | සෙවන ග්ලාස් හවුස්<br>තානායම අලුත්වැඩියා කිරීමේ දී අවශ්‍ය ඉදිකිරීම් උපාංග මිළදී ගැනිම | 16 | 649128 | 70098.50 |
| | කැන්ඩි ටිම්බර් ඩීලර්ස්<br>තානායම අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උස 86x36 1 ¼ කොස් ලී කැට පැනල් දොරවල් 04 හා 1 1/4 කොස් ලී 82x26 ඉදිරිපස දොරවල් දෙකක් ලබාගැනීම | 18 | 649129 | 82000.00 |

<table>
<tr><td></td><td><table><tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>1 1/4 කොස් ලී 8x36</td><td>16000/-</td><td>04</td><td>64000.00</td></tr><tr><td>1 1/4 කොස් ලී 82x26</td><td>9000/-</td><td>02</td><td>18000.00</td></tr><tr><td></td><td></td><td></td><td>82000.00</td></tr></table></td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td>නිහාල් ට්‍රේඩින් කම්පැණි<br>නගර සභා කාර්යාලයේ උඩු මහලේ ආරක්ෂක කුටිය ඉදිකිරීම හා ළදරු පාසල් ගොඩනැගිල්ල පුළුල් කිරීම සඳහා අවශ්‍ය අඩි 08 සීට් 09 හා අඩි 10 සීට් 27 සඳහාද<table><tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>අඩි 8</td><td>1085.00</td><td>09</td><td>9765.00</td></tr><tr><td>අඩි 9</td><td>1285.00</td><td>27</td><td>34695.00</td></tr><tr><td></td><td></td><td></td><td>44460.00</td></tr></table></td><td>19</td><td>649130</td><td>44460.00</td></tr>
<tr><td></td><td>දේශානි හාඩ්වෙයාර්<br>කාර්යාලය නවීකරණය කිරීමේ දී අවශ්‍ය ජල සැපයුම් උපාංග ලබාගැනීම</td><td>20</td><td>649131</td><td>19160.00</td></tr>
<tr><td>01/13</td><td>නිව් මල්ලිකා ගොවිසේවා<br>සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය බෙහෙත් හා පොහොර වර්ග මිළදී ගැනීම</td><td>22</td><td>649132</td><td>29805.00</td></tr>
<tr><td></td><td>රෝහිත විජේවර්ධන ක්‍රියේෂන්ස්<br>සම්පත් කේන්ද්‍ර 05 සඳහා 6'x3' ප්‍රමාණයේ ඩිජිටල් නාම පුවරු 08 හා පොලිතීන් තහනම් කිරීම සඳහා 12"x4" ප්‍රමාණයේ නාම පුවරු 05 සඳහා ගෙවීම<br>6'x3 flex Print 05 6300.00<br>12'x4' Flex Print 05 16800.00</td><td>23</td><td>649133</td><td>23100.00</td></tr>
<tr><td></td><td>එම්.ජී.පියසේන<br>2009 දෙසැම්බර් මාසයේ පෞද්ගලික බස්ගාල් ගාස්තු කොමිස් මුදල් ගෙවීම.</td><td>24</td><td>649135</td><td>18000.00</td></tr>
<tr><td></td><td>ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්<br>බෝම්බුව පරගහකුඹුර ක්‍රීඩාපිටිය වටා දැල් ආවරණය කිරීම කර්මාන්තයේ වැඩ කුළිය ගෙවීම</td><td>27</td><td>649138</td><td>48641.00</td></tr>
</table>

<table>
<tr><th></th><th></th><th></th><th></th><th></th></tr>
<tr><td></td><td>විජිත ගල් කැටයම්<br>සම්පත් කේන්ද්‍ර මධ්‍යස්ථාන 05 සඳහා සමරු ඵලක 20000.00<br>කුමාරගම පාර පළමු පටුමග කොන්ක්‍රීට් කිරීම 20000.00<br>විවෘත කිරීම සමරු ඵලකය<br>විදුණෑන පියස සමරු ඵලකය 25000.00</td><td>28</td><td>649139</td><td>65000.00</td></tr>
<tr><td>01/15</td><td>සෙවන ග්ලාස් හවුස්<br>36’x9'දැන්වීම් පුවරු 3 35850.00<br>කොම්පෝස්ට් බෝඩ් 01 925.00<br>කාර්යාලයේ ඇත/නැත පුවරු 01 3450.00<br>විදුණෑන පියස පුවරු 60'x120" 4400.00<br>නාන කාමර කන්නාඩි 01 2950.00<br>කීබෝඩ් 01 ලොක් යොදා සවිකිරීම 1900.00<br>පින්තූර 07 රාමු කිරීම 2100.00<br>කැට්ලොක් සවිකිරීම 250.00</td><td>29</td><td>649140</td><td>51825.00</td></tr>
<tr><td></td><td>සෙවන ග්ලාස් හවුස්<br>කාර්යාලයේ උඩු මහලේ ආරක්ෂක කුටිය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා අවශ්‍ය ප්ලයිවුඩ් හා තාර සීට් මිළදී ගැනීම</td><td>30</td><td>649140</td><td>35250.00</td></tr>
<tr><td>01/15</td><td>සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2009.12.01 සිට 2009.12.09 දින දක්වා ඉන්ධන බිල පියවීම
<table>
<tr><th>වර්ගය</th><th>ඒකක මිල</th><th>ප්‍රමාණය</th><th>වටිනාකම</th></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>978 ලී</td><td>71587.60</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>1615.00</td><td>02 කෑන්</td><td>3230.00</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>05 ලී.</td><td>256.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>130.20</td><td>50 ලී</td><td>6510.00</td></tr>
<tr><td>ටූ.ටී. 1/2</td><td>180.00</td><td>1 කෑන්</td><td>180.00</td></tr>
<tr><td>ලේන්සු</td><td>40.00</td><td>01</td><td>40.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>81805.60</td></tr>
</table>
</td><td>34</td><td>649142</td><td>81805.60</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2009.11.22 සිට 2009.11.30 දක්වා ඉන්ධන බිල පියවීම</td><td>35</td><td>649142</td><td>44672.90</td></tr>
</table>

<table>
<tr><td></td><td><table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>528 ලී.</td><td>38649.60</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>323.00</td><td>01 කෑන්</td><td>323.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>130.20</td><td>3650 ලී.</td><td>4752.30</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>15 ලී</td><td>768.00</td></tr>
<tr><td>ටූ.ටී.1/2</td><td>180.00</td><td>01 කෑන්</td><td>180.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>44672.90</td></tr>
</table></td><td></td><td></td><td></td></tr>
<tr><td>01/15</td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිෂ සේවා සමිතිය<br>2009.12.09 සිට 2009.12.15 දක්වා ඉන්ධන බිල පියවීම<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>454 ලී</td><td>33232.80</td></tr>
<tr><td>එන්ජින් ඔයිල්</td><td>323</td><td>01 කෑන්</td><td>323.00</td></tr>
<tr><td>ගියර් ඔයිල්</td><td>1662</td><td>01 කෑන්</td><td>1662.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>130.20</td><td>34 ලී</td><td>4426.80</td></tr>
<tr><td>ඩී.එස්.කෑන්</td><td>1615.00</td><td>02 කෑන්</td><td>3230.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>42874.60</td></tr>
</table></td><td>36</td><td>649142</td><td>42874.60</td></tr>
<tr><td></td><td>සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>දේගපිටිය පාලමට සම්බන්ධ පඩි පෙළක් ඉදිකිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම</td><td>37</td><td>649143</td><td>23099.78</td></tr>
<tr><td>01/15</td><td>කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>දේගපිටිය පාලමට සම්බන්ධ පඩිපෙළක් ඉදිකිරීම කර්මාන්තයේ අමතර බැම්මක ඉදිකිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම</td><td>38</td><td>649143</td><td>17448.81</td></tr>
<tr><td></td><td>ටී.ජ්.ටී.එච්.තෙබුවන<br>අංකඃ 67/1565 ට්‍රේලරය අලුත්වැඩියා කර තීන්ත ආලේප කර අකුරු ඇඳීම සඳහා</td><td>41</td><td>649146</td><td>40050.00</td></tr>
<tr><td></td><td>සෙන්ට්‍රල් ට්‍රේඩින් කම්පැණි<br>නගර සභා පෙර පාසල සඳහා සිවිලින් සීට් 100 මිළදි ගැනීම<br>4x4 රයිනෝ සීට් 01 342<br>සිවිලින් සීට් 100 342x100</td><td>42</td><td>649147</td><td>34200.00</td></tr>
<tr><td></td><td>නිව් හැපි ස්ටෝර්ස්<br>2001 වර්ෂයේ දී බළන්ගොඩ නගර සභාව විසින් මිළදි ගත් භාණ්ඩ වෙනුවෙන් නොගෙවූ බිල්පත් වලට අදාළ මුදල් ගෙවීම<br>( පළාත් පාලන කොමසාරිස්ගේ වාර්තාව හා 2009.12.24 දින සභා තීරණය පරිදි.)</td><td>43</td><td>649148</td><td>38460.25</td></tr>
<tr><td></td><td>ජී.කේ.හර්ෂා ධම්මිකා<br>නගර සභාවේ පෙර පාසල හා වැවේවත්ත පෙර පාසල සඳහා පොත් කට්ටල ලබාදීම වෙනුවෙන් අවශ්‍ය පොත් මිළදී ගැනීම</td><td>44</td><td>649149</td><td>12960.00</td></tr>
</table>

| වර්ගය | ඒකක මිල | ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|---|
| ලොකු කොටු | 21.50 | 120 | 2580.00 |
| ලොකු ඉරි | 21.50 | 120 | 2580.00 |
| ඩබල් රූල් | 21.50 | 120 | 2580.00 |
| රූල් නැති | 21.50 | 120 | 2580.00 |
| චිත්‍ර | 22.00 | 120 | 2640.00 |
| | | | 12960.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2009.12.23 සිට 201-.01.08 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් ලංකා බැංකුව | | | | |
| 09.12.23 | සැම් ඩැම් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි පු.ලි බළන්ගොඩ මහජන පොළ භූමියේ කසල කන්ද ඉවත්කිරීම සඳහා excavater machine ex 120 පැය 77.4 ක් යෙදීම වෙනුවෙන් ගෙවීම<br>පැය 01 2300.00<br>පැය 77.4 178020.00 | 06 | 800681 | 178020.00 |
| 2010 ජනවාරි මාසය | | | | |
| 01.05 | ලංකා විදුලිබල මණ්ඩලය<br>2009 දෙසැම්බර් මස විදුලිය බිල පියවීම නව බස්නැවතුම්පල | 01 | 800682 | 74316.60 |
| | ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>නව බස්නැවතුම්පල ජල බිල පියවීම 2009 දෙසැම්බර් මාසය | 02 | 800683 | 47284.20 |
| 01/08 | දේශීය ආදායම් කොමසාරිස්<br>2009 පෙබරවාරි හා මාර්තු මාස වලට අදාළ ජාතිය ගොඩනැගීමේ බදුමුදල් ගෙවීම<br>2009 පෙබරවාරි 6814.00<br>2009 මාර්තු **4808.00**<br>11622.00 | 03 | 800684 | 11622.00 |
| | දේශීය ආදායම් කොමසාරිස්<br>2009 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලට අදාළ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීම | 04 | 800684 | 38703.00 |

මෙම මුදල් ගෙවීම් සියල්ල අනුමත කරන ලදී.

07. **ඇස්තමේන්තු අනුමත කිරීම**:

පහත සඳහන් ඇස්තමේන්තු සභාවේ අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

| | | |
|---|---|---|
| 07:01 | බෝම්බුව යතුපිටියාවත්ත පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරිම | රු. 276153.75 |
| 07:02 | බුලත්ගම නිශාන්ත ගරාජය අසල පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 256926.57 |
| 07:03 | පල්ලෙවෙල කුඹුර අද්දර මාර්ගය කොන්ක්‍රීට්කර සංවර්ධනය කිරීම | 252930.83 |
| 07:04 | මුගුණමලේ කනත්තට යන පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම | 251263.62 |
| 07:05 | ඕළුගන්තොට සුසාන භූමිය ගේට්ටුව සාදා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 250287.57 |
| 07:06 | කුමාරගම ii පටුමග කොන්ක්‍රීට්කර සංවර්ධනය කිරීම | 250868.05 |
| 07:07 | පෙට්ටිගල පාර චාරිකා රෙස්ට්පාර අසල සිට කාණුව සංවර්ධනය කිරීම | 70272.70 |
| 07:08 | සරස්වතීවත්ත පාර කනත්ත ඉහල කොටස කාණුව ඉදිකිරීම | 250355.60 |
| 07:09 | උඩ ඇල්ලෙපොල ජේන්නෝනා මියගේ නිවාස වලට යන පාර පාලම් දෙක ඉදිකිරීම | 250778.29 |
| 07:10 | කොටුගොඩැල්ල වැකුඹුර කැකුණගහමුල්ල දක්වා මාර්ගය බැම් බැඳ සංවර්ධනය කිරීම | 251690.81 |
| 07:11 | බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතිය ආවරණය කිරීම කර්මාන්තය | 270093.03 |

ඉහත ඇස්තමේන්තු අනුමත කල සභාව , එම කර්මාන්ත අතරින් අංකඃ 07: 01 හා 07:07 සභාව මගින් සෘජු ශ්‍රමයෙන් ඉටුකිරීමටත් , 07:02,03,05 හා 06 කර්මාන්ත තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ඉටුකිරීමටත් , 08,09, සහ 2009.11.26 මහ සභාවේ අනුමත කරන ලද සරස්වතීවත්ත පාර පළමු පඩිපෙළ මැද කොටසේ පඩියෙදිම ( 97232.33 ) කර්මාන්තයත් , බලගහමුල සමෘද්ධි සමිතිය මගින් ඉටුකිරීමටත් , 07:04 කර්මාන්තය කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ඉටුකිරීමටත් 07:10 කර්මාන්තය බුලත්ගම සුහද ග්‍රාම සංවර්ධන සමිතිය මගින් ඉටුකිරිමටත් සභාවේ ආවරණ අනුමැතිය ලබාදෙන ලදී.

- සරස්වතීවත්ත සුසානාගාර ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම වෙනුවට සරස්වතීවත්ත පාර කනත්ත ඉහල කොටස කාණුව ඉදිකිරීමට ද සභාව තීරණය කරන ලදී.

- බළන්ගොඩ තානායම ඉඩම ආරක්ෂක වැට හා පැති බැම්ම ඉදිකිරීම කර්මාන්තයේ ( රු.6788294.61 ) ඇස්තමේන්තුව අනුමත කල සභාව , සභාව මගින් සෘජු ශ්‍රමයෙන් ඉටුකිරීමට ආවරණ අනුමැතිය ලබාදෙන ලදී.

**08. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත

**08:1 යථා පරිදි කල් දී ඇති යෝජනා :**

නැත.

**09. ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම**

---

**09:01 හියුම් පයිප්ප මිළදීගැනීම:**

මෙම සභාවේ සංවර්ධන කටයුතු සඳහා හියුම් පයිප්ප මිළදී ගැනීමට මිළ ගණන් කැඳවන ලදී. බලවින්න පෙරනිමි කොන්ක්‍රීට් අංගනයෙන් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පහත දැක්වේ.

| වර්ගය | ප්‍රමාණය | ඒකක මිල | වියදම |
|---|---|---|---|
| 1. 2'x8' | 06 | 8870.00 | 53220.00 |
| 2. 2'x4' | 04 | 5706.00 | 22824.00 |
| 3. 1 ½'x8' | 06 | 5502.00 | 33012.00 |
| 4. 1 1/2x4' | 04 | 3500.00 | 14000.00 |
| | | | 123056.00 |

ඉහත මිළ ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:02 **37-7933 ට්‍රැක්ටර් රථයේ අළුත්වැඩියාව:**

ඉහත අංක සඳහන් ට්‍රැක්ටරයේ වේග මීටරය අලුතින් සවිකිරීමේ දී අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට සිදු වූ අතර , ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි දිරාගිය කොටස් අළුත්වැඩියා කර පින්තාරු කිරීම සඳහා ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| ගාමිණී ඔටෝ ඉංජිනියර්ස් | නැෂනල් මෝටර්වේස් | ඉංජිනියර්ස් , තුඹගොඩ ,බළන්ගොඩ |
|---|---|---|
| 42300.00 | 45300.00 | 46100.00 |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් " ගාමිණී ඔටෝ ඉංජිනියර්ස් " ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:03 **අංක: 01 ජල බවුසරය අළුත්වැඩියාව :**

ඉහත සඳහන් ජල බවුසරයේ අළුත්වැඩියා කටයුතු සඳහා ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| තෙබුවන ගරාජය , ඕළුගන්තොට | ලක්මිණි මෝටර්ස් | නැෂනල් මෝටර්වේස් , තුඹගොඩ , බළන්ගොඩ |
|---|---|---|
| 31180.00 | 33875.00 | 35000.00 |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් තෙබුවන ගරාජයේ අවම මිළ ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:04 **<u>2010 වසර සඳහා ගල් සැපයීම:</u>**

2010 වසරේ නගර සභාවේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් සපයා ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලදී.

| ගල් වර්ගය | **එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර් ප්‍රවාහනය** | | එම්.ඩී.කේ.විජයසිරි , අංකඃ 68 කල්තොට පාර ,බළන්ගොඩ | එම්.ඩබ්.විමලසිරි , අංකඃ390 වතුකාරගොඩ ,බලන්ගොඩ | යශෝධා හාඩ්වෙයාර් , අංකඃ 18 , ශ්‍රී වීරසුන්දරාරාම මාවත,බළන්ගොඩ |
|---|---|---|---|---|---|
| | **සහිත** | **රහිත** | | | |
| 6"x9" ගල් කියුබ් 01 | **3200/-** | **2300/-** | 3480/- | 3401/- | 3385/- |
| 6"x4" ගල් කියුබ් 01 | **3500/-** | **2600/-** | 3700/- | 3550/- | - |
| 6"x12 ගල් කියුබ් 01 | **2850/-** | **1950/-** | 3000/- | 2975/- | 3000/- |
| 4"x4" ගල් කියුබ් 01 | **4900/-** | **4000/-** | 5250/- | 5137/- | 5374/- |
| 2"x2" ගල් කියුබ් 01 | **5000/-** | **4100/-** | 5300/- | 5175/- | 5183/- |
| 1" ගල් කියුබ් 01 | **5500/-** | **4600/-** | 5700/- | 5722/- | 5648/- |
| 1 ½" ගල් කියුබ් 01 | **5300/-** | **4400/-** | 5560/- | 4466/- | 5472/- |
| ¾" ගල් කියුබ් 01 | **5700/-** | **4800/-** | 5900/- | 5905/- | 5855/- |
| ½" ගල් කියුබ් 01 | **4200/-** | **3300/-** | 4450/- | 4500/- | 4554/- |
| ගල් කුඩු කියුබ් 01 | **2900/-** | **2000/-** | 3700/- | 3610/- | 3266/- |
| ABC කියුබ් 01 | **4900/-** | **4000/-** | 5856/- | 5874/- | 5900/- |

අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති බළන්ගොඩ , හපුගහකුඹුර යන ලිපිනය සඳහන් එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර් ආයතනයේ මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:05 **<u>2010 වසර සඳහා වැලි සැපයීම:</u>**

2010 වසරේ නගර සභාවේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වැලි සපයා ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලදී.

| අයිතමය | යශෝධා හාඩ්වෙයාර් අංකඃ 18ශ්‍රීවීරසුන්දරාරාම මාවත,බළන්ගොඩ | **ජී.ඩබ්.ඉන්ද්‍රලාල් , අංකඃ62, කිරිදිගල,බළන්ගොඩ** | දිමුතු පුත්‍රයෝ 55/3 දොරවෙල බළන්ගොඩ | ආර්.පී.ලාල් පතිරණ 24/සී කිරිදිගල බළන්ගොඩ. |
|---|---|---|---|---|
| වැලි කියුබ් 01 ( ප්‍රවාහනය සහිත ) | 4500/- | **4000/-** | 5200/- | 4350/ |

බළන්ගොඩ , කිරිදිගල අංක : 62 දරණ ලිපිනයේ පදිංචි ජී.ඩබ්.ඉන්ද්‍රලාල් යන අය විසින් ඉදිරිපත් කර ඇති අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

**10. යෝජනා :**

**10:01. ගරු සභාපති , ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

බෝම්බුව නිල්වලා ක්‍රීඩාපිටිය වටා දැල් ගැසීමේ කර්මාන්තය වෙනුවට බෝම්බුව යතුපිටියාවත්ත පාර ( ඇක්මන් මහතාගේ නිවස පාර ) සංවර්ධනය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව යෝජනාව සභා සම්මත විය.

පොදු වෙළඳසැල මාළු කඩ ටෙන්ඩර් කිරීම සම්බන්ධව අභියාචනාධිකරණයේ නඩු විභාගයක් පැවැත්වෙන බැවින් , මාළු කඩ අංක: 09 හා 10 ට පමණක් නොව , සියළුම මාළු කඩ කාමර සඳහා වු ටෙන්ඩරය මුළුමනින්ම අවලංගු නොකලහොත් , දැනට ටෙන්ඩර ලබාගෙන ඇති කඩ හා මීට පෙර ඔවුන් භුක්තිවිඳි කඩ කාමර මාරුවීම හා කඩ අහිමිවීම යන කාරණා මත ඔවුන්ට අසාධාරණයක් සිදුවන බව දන්වා අභියාචනයක් ඉදිරිපත් කර ඇති බැවන් අදාළ ටෙන්ඩරය මුළුමනින් අහෝසි කිරීමට යෝජනා කරමි. එමෙන්ම , ඔවුන් භුක්තිවිඳි ආකාරයට එම කඩ කාමර ලබාදීමටත් , පොදු වෙළඳසැලේ ජල බිල හා විදුලිබිල පියවීම සඳහා ප්‍රමාණවත් ආදායමක් නොලැබෙන බැවින් දැනට මාළු කඩ කාමරයකින් අයකරන මාසික කුළියට අමතරව , 2010 වර්ෂයේ පෙබරවාරි මස සිට මාළු කඩ මාසික කුළිය රු.2000/- කින් වැඩිකිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභා සම්මත විය.

පොදු වෙළඳසැල අංක: 17 දරණ කුකුළු මස් කඩය 2010 වර්ෂය සඳහා ටෙන්ඩර් ලබාගත් එම්.ජේ.එම්.ඉම්රාන් මහතා කඩය භාරගැනීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් හා දෙවන ලංසුකරු ද අදාළ මුදල ප්‍රතික්ෂේප කර ඇති බැවින් , පළමු ලංසුකරුගේ ටෙන්ඩර් ඇප මුදල් හා එක් මසක ගිවිසුම් ඇප මුදල් සභාව සතු කර , 2010 පෙබරවාරි 16 දින සිට 2010.12.31 දින දක්වා බදුදීමට තීරණය කරන ලදී.

**10:02. ගරු උපසභාපති , සුමේධ චමින්ද බස්නායක මැතිතුමා :**

බළන්ගොඩ තානායම නවීකරණය කිරීමේ කටයුතු සිදුකරන බැවින් , නව උත්සව ශාලාවක් ඉදිකිරීම සඳහා මුල්‍යප්‍රතිපාදන ලබාදෙන ලෙස ගරු සංචාරක අමාත්‍ය අචල ජාගොඩ මැතිතුමාගෙන් ඉල්ලීමක් කිරීමට යෝජනා කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10:03. ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා :**

මෙම නගර සභාව සතුව තිබෙන ගලි බවුසරය මෙම ප්‍රදේශයේ සහ පිට ප්‍රදේශවල සේවාවන් සඳහා කුළියට ලබාදීමෙන් විශාල ආදායමක් ලබාගත් අතර , මේ වන විට මෙම යන්ත්‍රය බොහෝ සේ අබලන් වී ඇති බැවින් , අලුතින් ගලි බවුසරයක් මිළදි ගැනීමට යෝජනා කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

බළන්ගොඩ ශාන්ත ජෝශප් වැඩිහිටි නිවාස පරිශ්‍රයේ මහජන සෞඛ්‍යට තර්ජණයක් වන ආකාරයට ඌරු කොටුවක් පවත්වාගෙන යන බව ප්‍රදේශවාසින් විසින් දැනුම් දී ඇති බැවින් ඒ

කෙරෙහි අවධානය යොමුකර එම උෟරු කොටුව ඉවත් කිරීමට පියවර ගන්නා ලෙස යෝජනා කරන ලදී.

10:04. **ගරු නාගරික මන්ත්‍රී , ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

බෝම්බුව පරගහකුඹුර ක්‍රීඩාපිටියට ඉතා අලංකාරව දිවා රාත්‍රී දෙකෙහිම ක්‍රීඩාකිරීමට හැකිවන අයුරින් සකස් කර ඇති බැවින් , එම ක්‍රීඩාපිටියට විජී ලාම්පු සවිකිරීමට කටයුතු කරන ලෙස යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. එම යෝජනාව සභා සම්මත විය.

10:05 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

මෙම සභාව මගින් මුදල් වෙන්කර බළන්ගොඩ බුලත්ගම නිශාන්ත ගරාජය අසල පාර කොන්ක්‍රීට් කිරීම සිදුකරනු ලබන අතර , මෙම මාර්ගයේ ඉතිරි කොටස ද සංවර්ධනය කර කිරීම සිදුනොකලහොත් , කරන ලද කාර්යය සම්පූර්ණ නොවන නිසා , මෙම අවස්ථාවේදීම ඒ සඳහා සභා මුදල් වෙන්කර එය ඉටුකරන ලෙස මෙන් යෝජනා කරන ලදී.

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සභා සම්මත විය.

**11. කාරක සභා වල වාර්තා සලකා බැලීම:**

2010.01.05 වන දින පවත්වන ලද සෞඛ්‍ය කමිටුවේ වාර්තාව හා 2010.01.06 දින පවත්වනු ලැබූ කර්මාන්ත කමිටුවේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාවන් අධ්‍යයනය කල සභාව , එම වාර්තා අනුමත කරන ලදී.

මහනුවර පල්ලෙකැලේ දී පැවැත්වෙන දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට මෙම සභාව ද ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරන බැවින් , ඒ සඳහා යන වියදම් සභා අරමුදලින් දැරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව එම යෝජනාව සභා සම්මත විය.

12. **ආදායම් - වියදම් හා අනෙකුත වාර්තා ඉදිරිපත් කිරීම:**

මාසයට අදාළව ආදායම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 11,042,232.06 |
| වෙනත් ලැබීම් | 5,111,912.76 |
| | ----------- |
| මුළු ලැබීම් | 16,154,144.82 |
| පුනරාවර්ථන වියදම් | 2,989,865.77 |
| වෙනත් වියදම් | 21,066,851.63 |
| | ------------- |
| මුළු වියදම් | 24,056,717.40 |
| | ========= |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2009.10.22 දින සිට 2009.12.22 දින දක්වා මෙම නගර සභාව සතු වාහන සඳහා වැය වූ ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව , එම වාර්තා සභාව විසින් අනුමත ලදී.

13. **වෙනත් කරුණු :**

13. **වෙනත් කරුණු:**

13:01 **ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , අතිශය තීරණාත්මක මැතිවරණයකට මුහුණ දී වැඩි ඡන්ද ලක්ෂ 18 කට වැඩි ප්‍රමාණයක් ලබාගනිමින් , අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අතිවිශිෂ්ඨ ජයක් ලබාගත් බව පැවසීය. මෙම මැතිවරණයේ දී " බඩට වඩා රට වැදගත් " බව රටට ආදරය කරන කෘතවේදී ජනතාව වටහාගෙන ඇති බව දැන්වීය. මෙම ස්වර්ණමය අවස්ථාව ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙන බව පැවසූ එතුමා , බටහිර බලවේගයන්ගේ කුමන්ත්‍රණ වලට හසුනොවී ශ්‍රී ලංකා ආසියවේ දියුණුතම රට බවට පත්කිරීමට අතිගරු ජනාධිපති ගෙන යන වැඩපිළිවෙල මේ රටේ අතිබහුතර ජනතාවක් අනුමත කර ඇති බව මෙම මැතිවරණයේ දී වඩාත් මැනවින් පැහැදිලි වූ බව සඳහන් කරන ලදී.

මෙම මැතිවරණයේ දී බලන්ගොඩ ආසනය එක්සත් ජනතා නිදහස් සංධානය වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ජයග්‍රහණය කිරීම සම්බන්ධව සිය සතුට පළකල අතර , ඉතිහාසය තුළ බලන්ගොඩ ආසනය එක්සත් ජනතා නිදහස් සංධානය මෙවැනි වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ජයග්‍රහණය කිරීම සිදු නොවූ බැවින් එය සුවිශේෂී කාරණාවක් වන බව ප්‍රකාශ කරන ලදී. ඒ සඳහා ඇප කැප වූ එක්සත් ජනතා නිදහස් සංධානයේ රත්නපුර දිස්ත්‍රික් නායක/බලන්ගොඩ සම සංවිධායකවරුන් , ප්‍රදේශයේ පළාත් පාලන ආයතන නියෝජිතයින් හා ඡන්දය ප්‍රකාශ කල සැමට සිය ස්තුතිය පිරිනමන බව දැන්වීය.

පොදු අපේක්ෂක සරත් පොන්සේකා මැතිතුමා මේ රටට විශිෂ්ඨ සේවයක් කල නිලධාරියෙකු ලෙස ජනතාවගේ ගෞරවයට , ප්‍රශංසාවට ලක්වෙමින් කටයුතු කල හැකිව තිබුණ ද එතුමා බටහිර කුමන්ත්‍රණ වලට හසුවී මේ රටට ද්‍රෝහියෙකු බවට පත්වුණ බව දන්වමින් සිය කථාව අවසන් කරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

පසුගිය 26 වැනි දා පැවති ජනාධිපතිවරණයේ දී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සිය ප්‍රතිවාදී අපේක්ෂකයාට වඩා මිලියන 1.8 ක්ද , 58.8% ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගනිමින් අතිවිශිෂ්ඨ ජයක් ලබාගත් බව සඳහන් කරන ලදී. එතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් ඡන්ද ප්‍රකාශ කල ශ්‍රී ලාංකීය ජනතාවට තමාගේ ගෞරවය හා ප්‍රණාමය පළකරන බව දැන්වීය. පොදු අපේක්ෂක සරත් පොන්සේකා මහතා ආසන 22 කින් ආසන 06 ක ජය තහවුරු කරගත් එම ආසන 06 කොටි ත්‍රස්තවාදීන් විසින් ඊලාම් රාජ්‍යයක් ඇතිකිරීම සඳහා තෝරාගෙන ඇති ප්‍රදේශයන් බව , ඊලාම් සිතියම අනුව පෙනී යන අතර , ඒ අනුව සරත් පොන්සේකා හා සම්බන්ධන් අතර රට බෙදීමේ කුමන්ත්‍රණකාරී ගිවිසුමක් තිබුණු බව පැහැදිලි වන්නේ යැයි පැවසීය.

එක්සත් ජනතා සංධානය බලන්ගොඩ ආසනය වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ජයග්‍රහණය කිරීම සම්බන්ධව සිය සතුට පළකල අතර , ඒ සඳහා ඇප කැප වූ රත්නපුර දිස්ත්‍රික්

සංවිධායකවරුන්/බලන්ගොඩ සම සංවිධායකවරුන් , ප්‍රදේශයේ පළාත් පාලන ආයතන නියෝජිතයින් හා ඡන්ද ප්‍රකාශ කල ඡන්දදායකයින් වෙත සිය ප්‍රණාමය පළකරන බව දැන්වීය.

සියළු දෙනාගෙන්ම ලැබුණු සහයෝගය මත මැතිවරණ ප්‍රචාරක කටයුතු සාර්ථක කරගැනීමට හැකි වු අතර , මෙවැනි විශිෂ්ඨ ජයක් ලබාගැනීමට ද එය විශාල පිටිවහලක් වු බව දැන්වීය. බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ එක්සත්ජාතික පක්ෂ මන්ත්‍රීවරයෙකු වු විජය කුමාර් මැතිතුමා ද අප පක්ෂයේ ජයග්‍රහණය තහවුරු කිරීම සඳහා දායකත්වය ලබාදුන් අතර , ඔහුට සිය ස්තූතිය පිරිනමන බව සඳහන් කරන ලදී.

බලන්ගොඩ බෝම්බුව පරගහකුඹුර ක්‍රීඩාපිටිය ඉතා දැකුම්කළුව සුන්දරව සකස් කර ඇති බැවින් , ප්‍රදේශවාසී තරුණ තරුණියන්ට ක්‍රීඩාවට නැඹුරුවීම තුළින් ගුණගරුක ශිෂ්ඨ සම්පන්න තරුණ පිරිසක් දැයට දායාද කල හැකි බව දැන් වු අතර , ප්‍රදේශයේ ජනතාවට පළුදායී වු එවැනි යෝජනාවන් ක්‍රියාත්මක කරවීම සම්බන්ධව සිය ස්තිතුය ගරු සභාපතිතුමන් වෙත පළකරන බව දැන්වීය.

මෙම සභාවේ ගරු උපසභාපතිතුමාගේ සහෝදරයෙකු ගරු සංචාරක අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්වරයෙකු ලෙස පත්ව ඇති අතර , ඔහු උපන් ගම වන බලන්ගොඩ ප්‍රදේශයට සේවය කිරිමට මහත් උනන්දුවකින් යුතුව සිටින බව තමන් වෙත දැණුම් දී ඇති බවත්, එබැවින් , ඒ කෙරෙහි අවධානය යොමුකර සභාවේ කටයුතු සඳහා අවශ්‍ය සහයෝගයන් ලබාගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරමින් සිය කථාව අවසන් කරන ලදී.

13:03 **<u>ගරු නාගරික මන්ත්‍රී, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමාඃ</u>**

ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වමින් , ශ්‍රී ලංකාවේ හයවැනි විධායක ජනාධිපතිවරණය නිමාවට පත්ව ඇති අතර , රටේ අති බහුතර ජනතාවක් මේවන විට ජයග්‍රහණයේ සතුට භුක්ති විදිනු ලබන බව දැන්වීය. මෙම ජයග්‍රහණය කලගුණදත් ජනතාවගේ විජයග්‍රහණයක් බව දැන් වු එතුමා , අතිගරු ජනාධිපතිතුමන්ට සිය සුභාශිංසනය පළකරන අතර , වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම " සුභ අනාගතයක් " වෙනුවෙන් රට ගොඩනැංවීමේ සංග්‍රාමය ශක්තිමත් කිරිමට ප්‍රාදේශීය දේශපාලන නායකයින් වන අපගේ ශක්තිය අතිගරු ජනාධිපතිතුමන් වෙත ලබාදෙමු යැයි පැවසීය.

වැඩිදුරටත් කථා කළ ගරු මන්ත්‍රීතුමා , ගරු දීපාල් ගුණසේකර මැතිතුමා ,වැවේවත්ත කාණු පද්ධතිය ඉදිකිරිම සඳහා ලක්ෂ 08 ක මුල්‍යමය ප්‍රතිපාදන ලබාදී ඇති අතර , මේවන විට බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඉදිකිරිම් කටයුතු සිදුකරන අතර , විධිමත් පරිදි එම කාණු පද්ධතිය සකස් කල යුතු බැවින් , මෙම සභාවේ අදාල නිලධාරින් යොදවා එය අධීක්ෂණය කිරිමට පියවර ගන්නා මෙන් ඉල්ලීමක් කරන ලදී.

කාර්යාල නවීකරණය කිරීම යටතේ මෙම සභාවෙන් ඉවත්කල මේස පුටු ආදිය ප්‍රදේශයේ පොදු සමිති සමාගම් වලට ලබාදීමට සභා තීන්දුවක් ගත් අතර , එය මෙතෙක් ක්‍රියාත්මක නොවනු බැවින් , ඒ කෙරෙහි නැවතත් සභාවේ අවධානය යොමු කරන බව දන්වමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.

13:04 **<u>ගරු නාගරික මන්ත්‍රී , යු.එච්.ගාමිණී මැතිතුමා ඃ</u>**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින් , සුනන්දාරාම මාර්ගයේ මාස 03 - 04 පමණ කාලයක කුණු එකතු කිරීම සිදුනොකල බැවින් , ඒ කෙරෙහි අවධානය යොමු කර කසල ඉවත්කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

14. **අවසානයඃ**
**ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා ඃ**

ගරු සභාපතිතුමා කථාකරමින් , සබරගමුව පළාතේ ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා , තානායමේ වැට ඉදිකිරීම සඳහා ලක්ෂ 17 ක මුදලකුත් , කසල කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ට්‍රැක්ටර් රථයකුත් , පොහොර හැලීම සඳහා යන්ත්‍රයක් මිළදි ගැනීමට ලක්ෂ 10 මුදලකුත් ලබාදුන් බව ගෞරවයෙන් යුතුව සදහන් කරන අතර , ඒ සම්බන්ධව ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, පළාත් පාලන අමාත්‍යවරයාටත් , ප්‍රධාන ලේකම්තුමා , අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සිය ස්තුතිය පිරිනමන බව දැන්වීය.බෝම්බුව පරගහකුඹුර ක්‍රීඩාපිටිය පසුගිය දා ගරු පේෂකර්ම අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමා අතින් විවෘත කල අතර , ක්‍රීඩාපිටියට අවශ්‍ය වොලිබෝල් දැල් 2 ක් හා වොලිබොල 02 ලබාදීමට ද එතුමන් කටයුතු කල බව දැන්වීය. එසේම තෑගි භාණ්ඩ ලබාදීම සම්බන්ධව එරංග බණ්ඩාර මැතිතුමාටත් සිය ස්තුතිය පිරිනමන බව දන්වමින් , අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු නාගරික මන්ත්‍රීවරුන්ට සිය ස්තුතිය පිරිනමන බව දන්වමින් සැමට සුභ සන්ධ්‍යාවක් ප්‍රාර්ථනය කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව.02.30 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.